# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,734 — 1959 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්ද—30.4.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන | | ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් | | ... | 1137 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | | 1138 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | | 1138 |
| වෙනත් පත් කිරීම් ... | ... | ... | 1139 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | | ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... | ... | ... | 1140 |
| මිළ පාලන දැන්වීම් ... | ... | ... | 1143 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | ... | ... | 1143 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් | | ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

### 1959 අංක 175

අ. ආ. කා. අංකය: C 218/56 (III)

ප්‍රවාහණ සහ රජයේ වැඩ ඇමති තැන්පත් ගරු ඇම්. සේනානායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා සවාධිනතා) රාජ සභා නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ, ප්‍රවාහණ සහ රජයේ වැඩ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්, හෙන්රි අබේවික්‍රම පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, 1959 අප්‍රේල් 25 වැනි දින සිට, ප්‍රවාහණ සහ රජයේ වැඩ ඇමති වශයනේ වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත්කළ බව මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 අප්‍රේල් 25 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායඞාලයේදී.

---

### 1959 අංක 176

අ. ආ. කා. අංකය: C 162/49 (III)

1959 අප්‍රේල් 13 වැනි දින, අංක 11,724 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද ප්‍රවාහණ සහ රජයේ වැඩ අමාත්‍යාංශයේ සථිර ලේකම් තනතුරෙහි සවකීය රාජකාරීවලට අතිරේකව වැඩ බැලීමට වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්, ඇල්. ඇස්. බි. පෙරේරා මහතාගේ පත්වීම, එහි සඳහන් පරිදි 1959 අප්‍රේල් 11 වැනි දින සිට වෙනුවට, 1959 අප්‍රේ 18 වැනි දින සිට ක්‍රියාත්මක වනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 අප්‍රේල් 27 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායඞාලයේදී.

### 1959 අංක 177

අංකය: ඞී. 21/රෙක්ට/71.

**යුඬ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් භාර ගන්නා ලද කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකින් ඉල්ලා අස්වීමක්**

1959 අප්‍රේල් මස 27 වැනි දින සිට කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකින් ඉල්ලා අස්වීම.

ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඩබ්ලිව්. විජේසේකර, සී. ඊ. ඇම්. ඊ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 21 වැනි දින,
කොළඹ 1.

---

### 1959 අංක 178

අංකය: ඞී./වී. ඇෆ්ජ./17/ඊ.

**යුඬ හමුදාව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් භාර ගන්නා ලද කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකින් ඉල්ලා අස්වීමක්**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1959 අප්‍රේල් මස 1 වැනි දින සිට යුඬ හමුදාවේ ලංකා ස්වේච්ඡා භට සේනාවේ සේවයේ නියුක්ත පහත සඳහන් කරන ලද නිලධාරි තැනගේ කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකින් ඉල්ලා අස්වීම භාර ගෙන තිබේ.

උප ලෙප්ට්ටිනන්ට් තැන්පත්, ඇස්. ඇස්. මොහිනුඞීන්, සී.සී.සී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ 1.

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම්

**1959 අංක 179**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය :—

අංකය : ඒ. 129/58.

1959 මාර්තු මස 30 වැනි දින පටන් එච්. ඊ. පීරිස් මහතා නිවාඩු පිට සිටින කාලය තුළ සහ නැවත නියමයක් කරනතුරු සී. ජී. ඇල්. මිසෝ මහතා (සී. සී. ඇස්.) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංකය : ඒ. 108/59.

1959 මාර්තු මස 23 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අලෙවි කිරීමේ කොමසාරිස් බී. ආර්. දේවරාජන් මහතා (සී. සී. ඇස්.) ස්වකීය රාජ්‍ය කාර්යවලට අතිරේකව සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ත්‍රාර් වශයෙන් වැඩ බැලීමට.

අංකය : ඒ. 80/58.

1959 ජනවාරි මස 13 වැනි දින සිට ඊ. ඇෆ්. ඩයස් අභයසිංහ මහතා පළාත් පාලන කොමසාරිස් වශයෙන්.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 අප්‍රේල් මස 27 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.
කොළඹ—1

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1959 අංක 180**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑම්. 2/56.

සී. එච්. ද එස්. ගුණවර්දන මහතා 1959 අප්‍රේල් 8 වැනි දින පටන් 19 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරන තුරු ගම්පහ දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට හා ගම්පහ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඒ. 2/48.

එස්. ආර්. විජෙයතිලක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 27 වැනි දින, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක. 7,138/පී. නඩුවේ තීන්දුව දීමට, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 35/48.

සී. පී. තිස්සංග මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 27 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේ අංක 10,295/එල්සී. නඩුවේ තීන්දුව දීමට හා 1959 මැයි 8 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේ අංක. 10,154/එල්සී. නඩුවේ තීන්දුව දීමට හා කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේ අංක 12,717/එල්සී. නඩුව ඇසීමට, කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 29/48.

එල්. සමරතුංග මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 29 වැනි දින, මහනුවර දිස්ත්‍රික් උසාවියේ අංක. පී. 4,671 නඩුවේ තීන්දුව දීමට, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පීපී. 2/59.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්දන මහතා 1959 අප්‍රේල් 17 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, ගම්පහ මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පීපී. 5/59.

කේ. ඒ. පී. රණසිංහ මහතා ලංකා අධිකරණ සේවයේ නිරධාරියකු වශයෙන් වැඩ බැලීමට හා එෆ්. ඊ. ඇලස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, 1959 මාර්තු 30 වැනි දින පටන් 1959 අප්‍රේල් 16 වැනි දින දක්වා, මහනුවර මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පීපී. 12/58.

බී. සේනාරත්න මහතා ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන් හා 1959 අප්‍රේල් 6 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල, මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට කුරුණෑගල නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 46/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 27 වැනි දින, නුවර එළියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 15,695 නඩුව ඇසීමට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පීපී. 5/59.

ටී. සී. ජී. ද අල්විස් මහතා ලංකා අධිකරණ සෙවයේ නිලධාරියකු වශයෙන් හා 1959 මාර්තු 30 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පීපී. 4/59.

ඒ. වෛත්‍යලිංගම් මහතා 1959 අප්‍රේල් 11 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, කොළඹ නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 15/48.

එෆ්. සී. පෙරේරා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් 20 වැනි දින, කොළඹ රික්වැස්ට් උසාවියේ අංක 67,939, 69,031, 69,429, 69,998, 70,286, 70,546, 71,374, 70,542, 71,514, 68,217, හා 58,880 නඩුවල තීන්දුව දීමට, කොළඹ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 71ඒ/51.

සී. විමලරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඕ. සල්ගාදු මහතා 1959 අප්‍රේල් 18 වැනි දින, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. එම්. තර්මලිංගම් මහතා 1959 අප්‍රේල් 21 වැනි දින. යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපණේ මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 51/ඒ54.

ටී. ජේ, රාජරත්නම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒසීමාම්පිල්ලේ මහතා 1959 අප්‍රේල් 18 වැනි දින පටන් 25 වැනි දින දක්වා, මන්නාරමේ අතිරේක මහෙස්තාත්‍ර් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 23ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. යටවර මහතා 1959 අප්‍රේල් 30 වැනි දින පටන් 1959 මැයි 4 වැනි දින දක්වා හා 1959 මැයි 9 වැනි දින පටන් 12 වැනි දින දක්වා, මහනුවර ගම්පොල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68සී/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1959 අප්‍රේල් 20 වැනි දින, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 14/48

ජේ. එන්. සී. තිරුවෙල්වම් මහතා 1959 අප්‍රේල් 23 වැනි දින, කොළඹ කොටුවේ පිහිටි මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 15,481 හා 16,203 නඩුවල තීන්දුව දීමට, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට (කොළඹ කොටුවේ පිහිටි උසාවියේ) හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒෆ්. වී. එච්. ලාබ්‍රොයි මහතා 1959 අප්‍රේල් 20 වැනි දින, නුවරඑලියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑලියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑලියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට

අංකය : ජේඑල්. 17ඒ/51.

එන්. එදිරිසිංහ. මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. පී. විජේතුංග මහතා 1959 අප්‍රේල් 20 වැනි දින පටන්, මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මාතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6ඒ/48.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, සී. සී. සෝමසේගරම් මහතා 1959 අප්‍රේල් 20 වැනි දින පටන්, යාපනේ අතිරේක මහෙසාත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට. යපානේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, යාපනේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා කයිට්ස්, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු. එන්. බී. ද එස්. විජේසේකර මහතා 1959 අප්‍රේල් 21 වැනි දින පටන්, කළුතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1959 අප්‍රේල් 27 වැනි දින පටන් 29 වැනි දින දක්වා, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බතොලිමියුස් මහතා 1959 අප්‍රේල් 22 වැනි දින, නුවරඑලියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑලියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට නුවරඑලියේ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. තයිල්ස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා 1959 අප්‍රේල් 22 වැනි දින පටන්, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොසාරිස් ධුරයට හා යාපනේ මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්. පී1/48.

ටී. ජේ. රාජරත්නම් හා ආර්. පරමකුරු යන මහතුන් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එම්. අබුතහීර් මහතා 1959 අප්‍රේල් 25 වැනි දින පටන් 1959 මැයි 2 වැනි දින දක්වා, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් ධුරයට මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය. පිඑල්/යූ. 2/48.

ජේ. ඩබ්ලිව්. බී. උඩලාගම මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. එස්. මහලේකම මහතා 1959 අප්‍රේල් 11 වැනි හා 13 වැනි දියන්හි, මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ හරිස්පත්තු, උඩහේවාහැට හා පහත හේවාහැට ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඒ. 14/48.

සී. එන්. ඒෆ්. ද සිල්වා මහතා නැති අතර, සී. එල්. ඩබ්ලිව්. ගුණසේකර මහතා 1959 අප්‍රේල් 13 වැනි දින, රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත, මැද හා නවදුන් කෝරලයන්හි ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය. පීඑල්-ඊ. 1/48.

එම්. එශෙම්පර නාදන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු. එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1959 අප්‍රේල් 20 වැනි හා 21 වැනි දිනයන්හි, මඩකලපු දිස්ත්‍රික්කයේ අක්කර රෙයි හා පනාමා පත්තු, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරජා මහතා 1959 අප්‍රේල් 28 වැනි දින පටන් 30 වැනි දින දක්වා, පේදුරු තුඩුව දිස්ත්‍රික්කයේ තැන්මරඩචි, පච්චිලෙයිපල්ලෙයි-කරච්චි, පූනකාරි-තුන්නුකායි, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බලීමට.

අංකය : පීඑල්/වී 1/48.

එස්. වෙලෙමුරුගු මහතා නැති අතර, ටී. මයිල්වාගනම් මහතා 1959 අප්‍රේල් 21 වැනි හා 22 වැණි දිනයන්හි වවුනියාවේ හා මන්නාරම් දිස්ත්‍රික්කවල, දකුණු වවුනියාවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා මාන්තෙයි ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර, එම්. එම්. අබුතහීර් මහතා 1959 අප්‍රේල් 29 වැනි දින, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 5/54.

ඊ. එම්. මතියපරනම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. කුමාරනායගම් මහතා 1959 අප්‍රේල් 30 වැනි දින, 1959 මැයි 2 වැනි, 4 වැනි හා 5 වැනි දිනයන්හි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තු ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/සී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ගුණසේකර මහතා 1959 අප්‍රේල් 20 වැනි දින හා 22 වැනි දින පටන් 24 වැනි දින දක්වා, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා වැලිගම කෝරලේ හා සභාපති වශයෙන් වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ හා ගඟබඩ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 අප්‍රේල් 22 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායර්‍යාලය,
තැ. පෙ. අංකය, 573,
කොළඹ 12.

---

## වෙනත් පත් කිරීම්

**1959 අංක 181**

අංකය : ඒ. ජේ. 2/8.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින් පී. ද ඇස්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1959.4.23 වෙනි දින සිට කොළඹ නියෝජ්‍ය පිස්කල් ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් පත් කර ඇත්තේ ය.

දිව්රුම් සම්බන්ධ ආඥාපණතේ 12 වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් 1959 අප්‍රේල් මස 23 වෙනි දින සිට ජේ. එම්. බාරොන් සිංඤෝ මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයෙකු වශයෙන් පත් කර ඇත්තේ ය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්,

1959 අප්‍රේල් මස 13 වෙනි දින සිට කේ. නල්ලෛයිනාදන් මහතා නැවත වැඩභාරගන්නාතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ සමන්තුරෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. එල්. පැට්රික් මහතාද,

1959 අප්‍රේල් මස 13 වෙනි දින සහ 14 වෙනි දින ඒ. කන්දයියා මහතා නොමැති කාලය තුළ මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එස්. එම්. තියොපිල්ලස් මහතාද,

1959 අප්‍රේල් මස 15 වෙනි දින සිට ඒ. කන්දයියා මහතා නැවත වැඩ භාරගන්නා තුරු මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඒ. පෙරුමයිනාර් මහතාද,

1959 අප්‍රේල් මස 24 වෙනි දින සිට යාපනේ දිස්ත්‍රික්කයේ වෙලනෙයි-කයිට්ස් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයට වී. කන්දයියා මහතාද,

1959 අප්‍රේල් මස 25 වෙනි දින සිට ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු මහතා නැවත වැඩ භාරගන්නා තුරු හලාවත දිස්ත්‍රික්කයේ කමල් පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එල්. එස්. පීටර්ස් මහතාද, පත්කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 27 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

---

### 1959 අංක 182

අංකය : ඊබී/ඒ. 204/2.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡෙදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිඞ කරණ ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි සථිර ලේකම් විසින් පහත සඳහන් පත් කිරීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. කළුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඩබ්ලිව්. පතිරන මහතා, සවකීය රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් මස 15 වැනි දින සිට, කළුතර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් නියෝජ්‍ය පිස්කල්, බේරුවල රේගු අයකැමි හා කළුතර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් කැඩී බිඳී ගිය යාත්‍රා භාර ගන්නා නිලධාරි.

2. මඩකලපුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ජේ. වී. පොන්සේකා මහතා, සවකීය රාජකාරිවලට අතිරේක වශයෙන් 1959 අප්‍රේල් මස 15 වැනි දින සිට, නැගෙනහිර පළාතේ පිස්කල්, මඩකලපු පාලන දිස්ත්‍රික්කයේ රේගු අයකැමි, මඩකලපු පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් කැඩී බිඳී ගිය යාත්‍රා භාර ගන්නා නිලධාරි, මඩකලපුව පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් නියෝජ්‍ය මාස්ටර් ඇටෙන්ඩන්ට් හා මඩකලපුවේ බන්ධනාගාර අධිකාරී.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 22 වැනි දින,
සවදේශ කටයුතු භාර ඇමති කායඞාලය,
කොළඹ 7.

---

### 1959 අංක 183

මගේ අංකය : ඊබී/ඒ—258.

සවදේශ කටයුතු භාර ගරු ඇමති තුමා පහත සඳහන් පත්වීම් කිරීමට සතුටු වී ඇත :—

කළුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඩබ්ලිව්. පතිරන මහතා, 1959 අප්‍රේල් මස 15 වැනි දින සිට, සවකීය රාජකාරි වලට අතිරේක වශයෙන්, කළුතර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැව්රල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

මඩකලපුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ජේ. වී. පොන්සේකා මහතා, 1959 අප්‍රේල් මස 15 වැනි දින සිට, සවකීය රාජකාරි වලට අතිරේක වශයෙන්, මඩකලපුව පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැව්රල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 24 වැනි දින,
සවදේශ කටයුතු පිළිබඳ ඇමති කායඞාලයේ දීය.
කොළඹ 7.

---

### 1959 අංක 184

වර්ෂ 1951කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ 12(1) වැනි වගන්තිය යටතේ සවදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1959 ජනවාරි මස 16 වැනි දින සිට 1959 ජූනි 30 වැනිද වනතුරු හම්බන්තොට අධිකරණ කොඨාශයේ ක්වාසි තනතුරට හම්බන්තොට "සීතාර් විලා" හි තුවන් කිචිල් බූරා මහතා පත් කරන්ට යෙදුනා ඇත.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 9 වැනි දින,
කොළඹ දීය.

---

### 1959 අංක 185

වර්ෂ 1951කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපණතේ 12 (1) වැනි වගන්තිය යටතේ සවදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් 1959. 2. 12 දින පටන් 1959. 5. 11 වැනිද වනතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ සම්මන්තුරෙයි හා වැගම් පත්තු කොට්ඨාශයේ ක්වාසි තනතුරට සම්මන්තුරෙයි අංක 1 කොට්ඨාශයේ පදිංචි මොහමඩ් ලෙබ්බෙ උඩෙයියාර් උදුමා ලෙබ්බෙ මහතා පත් කරන්ට යෙදුනා ඇත.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1959 අප්‍රේල් මස 8 වැනි දින,
කොළඹ.

---

## ආණ්ඩුවේ නිවේදන

### 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

#### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) වෙනි හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමත්‍ය මානික්කු වඩුමේස්ත්‍රි හෙන්ද්‍රික් ද සිල්වා වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කෑගලු දිස්ත්‍රික්කයේ කිනිගොඩ කෝරලේ ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කරමි :—

(1) පරපේ පදිංචි ගරු වෙල්හේනේ ඥානසිරි ස්ථවිරයන් වහන්සේ.

(2) කිවුල්පනේ පදිංචි ගරු ඇතුල්ගම සිරිනිවාස ස්ථවිරයන් වහන්සේ.

(3) රඹුක්කන යටපාවල පදිංචි කලුආරච්චිලාගේ එඩ්වින් ජයතිලක.

(4) කොටගම පදිංචි රත්නායක මුදියන්සේලාගේ පුංචිරාලහාමි රත්නායක.

(5) පින්නවල පදිංචි පිකිරිබණ්ඩා ගුණතිලක කලුගල්ල.

(6) දැලිවල පදිංචි සුබසිංහ මුදියන්සේලාගේ කිරිබණ්ඩා.

(7) නිල්වක්ක පදිංචි බිංගිරිබණ්ඩා මුණසිංහ.

(8) වලල්ගොඩ පදිංචි සෝමදේව වෛද්‍යප්‍රේම.

(9) දොඹේමඩ පදිංචි කුරුප්පු ආරච්චිලාගේ පොඩිමහත්මයා.

(10) දඹුල්ල පදිංචි දිවුනු ගල්ගේ කිරි බණ්ඩියා.

(11) නෙහෙල්ම පදිංචි ජයමුණිගෙදර ජිනදාස.

(12) ගබ්වල පදිංචි ගාමිණි විජේතුංග.

(13) පරපේ පදිංචි වරුසමාන දේවගේ කිරා.

(14) වල්ගම පදිංචි ඔරුතොට ආරච්චිගේ ලුවිස් කරුණානායක.

(15) නුගවෙල පදිංචි බස්නායක ආරච්චිලාගේ අප්පුහාමි බස්නායක.

(16) වහව පදිංචි වන්සපුර ආරච්චිගේ ආනන්ද සිරිසේන.

(17) කොස්සින්න පදිංචි පෝහත් ලුසියන් ස්ටැනිස්ලෝස් සෙනසිංහ.

(18) හේවාදිවෙල පදිංචි ගුරන්ගේ ජෝන් ඩැනියල්.

(19) ගොඩගන්දෙනිය පදිංචි මෙගසූරිය මුදියන්සේලාගේ ගුණතිලක.

(20) කිරිවන්දෙනිය පදිංචි හෙන්නකාරලලාගේ උක්කුරාල.

(21) පින්නවල පදිංචි මුහන්දිරම් රාලලාගේ පොඩිරාළහාමි.

(22) ගල්පිටිය පදිංචි කිරිහාමිලාගේ ඩිංගිරි බණ්ඩා විජේරත්න.

(23) කලුගල්ල පදිංචි ඉඩම්පිටිය රාලලාගේ ජයතිලක බණ්ඩා.

(24) හැරම්පිපාන පදිංචි මංගලගම බ්‍රාහ්මණ රාලලාගේ පිංකිරි මුදියන්සේ.

(25) තිල්වක්ක පදිංචි සුන්දරප්පෙරුම රාලලාගේ මුදියන්සේ සුන්දරප්පෙරුම.

(26) කුඩාගම පදිංචි රන්කොත්ගේ දාවිත්.

(27) වහව පදිංචි හෙක්ටර් පැරකුම් අබයසිංහ.

(28) කොටගම පදිංචි ලොකු බණ්ඩාර පිලිමතලාව.

(29) කිවුල්පනේ පදිංචි කෙහෙල්පත්තල රාලලාගේ රන්බණ්ඩා.

(30) දිඹුල්ගමුව පදිංචි විජේලත් ජේඩිගේ සිරිල් ජයවීර.

(31) මාදන පදිංචි මර්වින් මාදන.

(32) දුනුකේවල පදිංචි ජයසිංහ දේවගේ සුවාරිස්.

(ආ) ඉහත කී මණ්ඩලයේ සභාපති වශයෙන් රඹුක්කන, යටපාවල පදිංචි කලුආරච්චිලාගේ එඩ්වින් ජයතිලක මහතා පත් කරමි,

තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා තිලය දැරියයුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනසිට අවුරුදු 2ක් විය යුතුයයි නිශ්චය කරමි.

ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා,
අධිකරණ අමාත්‍ය.

1959 අප්‍රේල් මස 24 දින,
කොළඹදීය.

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) වෙනි හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය මානික්කු වඩුමේස්ත්‍රි හෙන්ද්‍රික් ද සිල්වා වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කෑගලු දිස්ත්‍රික්කයේ ඔතර සහ ගම්දොලහ පත්තු. ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කරමි :—

(1) වච්චාරම පදිංචි ගරු හපුගොඩ සිද්දත්ත ස්ථවිරයන් වහන්සේ.

(2) වතුදෙනිය පදිංචි ගරු ඊරියමඩිත්තේ ධම්මජෝති ස්ථවිරයන් වහන්සේ.

(3) දේවාලේගම පදිංචි දොන් ඩැනියල් අල්විස් පැස්කුවල් පණ්ඩිතරත්න.

(4) කෙහෙල්වතුගොඩ පදිංචි සිරිමෙවන් ජයවීර.

(5) අඹුවන්ගල පදිංචි පිංචි අප්පුහාමි රාමනායක.

(6) වද්දෙනිය පදිංචි සුබසිංහ ආරච්චිලාගේ මුදියන්සේ සුබසිංහ.

(7) කොන්දගල පදිංචි වීරසේකර සෙනෙවිරත්න මුදියන්සේලාගේ සෙනෙවිරත්න.

(8) කුරුඳුවත්ත ජේපයාපිල්ඩි ජනපදයේ පදිංචි පිංකිරිබණ්ඩා ගන්ගොඩ.

(9) ගන්නාගොඩ පදිංචි විජේකෝන් මුදියන්සේලාගේ පුංචි නිලමේ විජේකෝන්.

(10) වේරගොඩ පදිංචි ජයසූරිය ආච්චිල්ලාගේ පිංකිරි බණ්ඩා.

(11) කහගල්ල පදිංචි කන්දෙ රාලලාගේ රන්බණ්ඩා.

(12) ඇඳුරාපොත පදිංචි රාජපක්ෂ ගමරාලලාගේ ඩිංගිරි බණ්ඩා.

(13) උඩුගොඩපිටිය පදිංචි පුලිඟු රාලලාගේ පිංචි අප්පුහාමි.

(14) කන්දෙගෙදර පදිංචි හපු ආරච්චිලාගේ පියසේන.

(15) මාරුක්වතුර පදිංචි වීරසිංහ ආරච්චිගේ ඉසදෝරු වීරසිංහ.

(16) ඊරියමඩිත්ත පදිංචි රතාවි ආච්චිලාගේ කිරිමුදියන්සේ.

(17) පල්ලෙවෙල පදිංචි විජේසුන්දර මුදියන්සේලාගේ කිරි බණ්ඩා.

(18) තඹවිල පදිංචි නරසිංහ ආච්චිලාගේ ඩිංගිරි බණ්ඩා නරසිංහ.

(19) රංගල්කන්ද පදිංචි මොහොට්ටාලලාගේ මොහොට්ටි අප්පුහාමි.

(20) රන්වල පදිංචි අමරසිංහ ආරච්චිලාගේ පොඩි අප්පුහාමි.

(21) ඇගල්ල පදිංචි සමරතුංග රන්දුනු අප්පුහාමිලාගේ දොන් ආරොන් අප්පුහාමි.

(22) ලීණියකඩුව පදිංචි බෝදිනාරායන ආචාරිගේ සේදිරිස් හාමි.

(23) පින්නාගොඩ කන්ද පදිංචි ආරච්චිලාගේ ගුණවර්ධන.

(24) බෝදාවල පදිංචි මාරසින් ජේඩි දූරයලාගේ සියාතුවා.

(25) මංගෙදර පදිංචි කලුඅච්චි මොහොට්ටාලගේ උක්කු බණ්ඩා.

(අ) ඉහත කී මණ්ඩලයේ සභාපති වශයෙන් දේවාලේගම පදිංචි දොන් ඩැනියල් අල්විස් පැස්කුවල් පණ්ඩිතරත්න මහතා පත් කරමි,

තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා තිලය දැරියයුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනසිට අවුරුදු 2ක් විය යුතුයයි නිශ්චය කරමි.

ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා,
අධිකරණ අමාත්‍ය.

1959 අප්‍රේල් මස 23 දින,
කොළඹදීය.

---

ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් පියදාස ප්‍රජාපාල ද සොයිසා ශ්‍රී ගුණවර්ධන මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුලත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 21 වැනි දින,
කොළඹ දීය.

---

ඉංග්‍රීසි භාෂාවෙන් කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුලත නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට රොනල්ඩ් ජූලියන් ඇශ්පෝඩ් ද ක්‍රෙට්සර් මහතාට දෙන ලද බලපත්‍රය, නොතාරිස් වරුන් පිළිබඳ ආඥාපණතේ (91 වැනි පරිච්ඡේදයේ) 9 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල අනුව ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අස්කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹදීය.

## 4 ඒ පෝරමය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණත

#### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පණතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයකුගේ විරුඬතාවයක් ඇත්නම්, කුමන කාරණ නිසා එවැනි විරුඬතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිඬකළ දින සිට මාසයක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමත කරන බවයි. විරුද්ධවන සෑම අයකුගේ සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර.
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ කොමසාරිස් තැන.

කොළඹ 1959ක් වූ අප්‍රේල් මස 27 වෙනි දින දීය.

#### උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල |
|---|---|---|
| P 1917—25.10.50 | .. | තාන්ඩවන් අලගම්මාල්, වූටන් වත්ත, කොටගල |
| P 2164—25.9.50 | .. | කදිර්වේල් වෙව්විවේල්, කැළේවත්ත වත්ත, කොටගල |
| P 3690—30.11.50 | .. | මුත්තයියා රාමලිංගම්, ඩිරේටන් වත්ත, කොටගල |
| P 4258—30.11.50 | .. | අප්පු ගෝපාල්, මහා ඩිරේටන් වත්ත, කොටගල |

---

## 4 බී පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණත

#### පණතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩ බලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පණතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමත කිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුඬතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුඬතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිඬ කළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමත කරන බවයි. විරුඬවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුඬවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන.

1959ක් වූ අප්‍රේල් මස 27 වෙනි දින
කොළඹ දීය.

#### උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| P 1144—29.9.50 | .. | වීරමලෙයි පලනි නොහොත් පලනිවේල්, පුන්කන්ද කොටස, මවුන්ට් වර්නන් වත්ත, කොටගල | මරිඅම්මාල් (භාර්‍යාව) |
| P 1180—29.9.50 | .. | රෙන්ගසාමි කාදන්, පුන්කන්ද කොටස, මවුන්ට් වර්නන් වත්ත, කොටගල | මාරියායි (භාර්‍යාව), සිවසාමි (පුතා), රාමසාමි නොහොත් වීරසාමි (පුතා), වේලායි (දුව), පෙරිය සාමි නොහොත් නාගමුත්තු (පුතා), අන්නායි (දුව), මාරියායි නොහොත් වල්ලිඅම්මෙයි (දුව), සුබ්‍රමානියන් (පුතා), රාසම්මා (දුව) |
| P 1192—29.9.50 | .. | මුත්තු කන්දසාමි, පුන්කන්ද කොටස, මවුන්ට් වර්නන් වත්ත, කොටගල | මුක්කායි (භාර්‍යාව), වේළු (පුතා), අන්ගම්මා නොහොත් තෙයිවානෙයි (දුව), සෙල්ලම්මා (දුව), නාගම්මා (දුව), කාවේරි (දුව), රත්නම් නොහොත් ආරුමුගම් (පුතා), අන්නලෙච්චුමි (දුව), මාරියායි (දුව) |
| P 1872—25.10.50 | .. | මුත්තුසාමි ආරුමුගම්, වූටන් වත්ත, කොටගල ... | අරුක්කනි (භාර්‍යාව), පාන්ඩියන් (පුතා), පූඹායි (දුව), නඩරාජා (පුතා), වේළුසාමි (පුතා) |
| P 2122—25.10.50 | .. | අන්ගප්පමුදලි සෙන්ගෝදන්, බෝගහවත්ත වත්ත, කොටගල | සුප්පම්මාල් (භාර්‍යාව), තන්ගවේල් (පුතා), ආරුමුගම් (පුතා), ආනන්දයි (දුව), කිට්නන් (පුතා), ආරායි නොහොත් රාසමනි (දුව), බාලසුන්දරම් (පුතා), මුරුගන් නොහොත් ෂන්මුගවේල් (පුතා), නඩරාජා (පුතා), මීනාච්චියම්මා (දුව), සන්දරසේගර (පුතා) |
| P 2565—30.10.50 | .. | මුත්තුසර්වෙයි සුන්දර රාජ්, ක්‍රෝගිලී වත්ත, පතන | සෙල්ලම්මාල් නොහොත් සාලාච්චි (භාර්‍යාව), රාජරත්නම් නොහොත් මුත්තුක්‍රිෂ්නන් (පුතා), කමලම් (දුව), තනපාකියම් (දුව), මුත්තුකුමාරසාමි (පුතා), පත්මනාදන් (පුතා) |
| P 2576—9.11.50 | .. | සිදම්බරම් රාමසාමි පිල්ලෙයි, ඩෙරික්ලෙයාර් වත්ත, කොටගල | තයිලම්මෙයි (භාර්‍යාව), සිදම්බරම්පිල්ලෙයි නොහොත් සිවලිංගම් (පුතා), සෝමසුන්දරම් (පුතා) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියා පදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| P 2807—16.11.50 | .. | ජෝකියන් සෙබස්තියන් නොහොත් හැන්රි, අංක 9, සිරිවිලාස්, කොටගල | ජෙබමාලෙයි (භායඝාව), සවරිමුත්තු (පුතා), එලිස බෙත් (දුව) |
| P 3057—4.11.50 | .. | පෙරුමාල් මාරිමුත්තු, ඩෙරික්ලෙයාර් වත්ත, කොටගල | සන්දනම් (භායඝාව) |
| P 4120—30.11.50 | .. | ඉලන්ගන් අරුනාසලම්, ඩිරේටන් වත්ත, කොටගල | ආරායි (භායඝාව), නවමනි (දුව), අර්ජුනන් (පුතා), සුන්දරම් (පුතා), කාතායි (දුව), මයිල්වාගනම් (පුතා) |
| N 1351/R—2.9.50 | .. | පලනියන්ඩි නොහොත් මල්ලන් පිච්චෙයි, අංක 2, කෙළින් වීදිය, නානුඔය | කමලම් (භායඝාව), ලෝගනාදන් (පුතා) |
| P 3602—30.11.50 | .. | කදිර්වේල් දෙරෙයිසාමි තන්ගයියා, වූටන් වත්ත, කොටගල | සාක්කම්මාල් (භායඝාව), සුප්පයියා නොහොත් රාමයියා (පුතා), තන්ගම්මා (දුව), පාර්ලන් නොහොත් ලෝගනාදන් (පුතා), දෙරේසාමි නොහොත් තන්ගරාජ් (පුතා) |
| P 3618—30.11.50 | .. | ආරුමුගම් පෙරුමාල්, ඩිරේටන් වත්ත, කොටගල ... | වල්ලි (භායඝාව), රාජේස්පරී (දුව) |
| P 4058—9.12.50 | .. | ජේසුදසන් ජෙයරාජ්, විලියම්ගේ වැන්දඹුවවූ මන්ගල පූරනම්, සෑම් ජේසුදසන් මහතා බාරේ, ග්ලැස්ගෝ වතුයාය, අග්‍රපතන | මෝසස් මනෝහරන් තනපාලන් (පුතා), ජේයා ජෝතිමනි (දුව), එලිසබෙත් රෙබෙකා (දුව), මනෝරා තේවතුනෙයි (දුව), හෙලන් සුගුන රාජම්මාල් (දුව), තුරෙයිබාලසිං (පුතා) |
| P 4065—18.11.50 | .. | කරුප්පයියාගේ වැන්දඹුවවූ පෙරියකරුප්පන් රාක්කි, දිඹුල වත්ත, කොටගල | සෙල්ලයියා නොහොත් පොන්නුසාමි (පුතා) |
| P 4122—30.11.50 | .. | අරුලප්පන් සවරිමුත්තු, ඩිරේටන් වත්ත, කොටගල | අන්තෝනිඅම්මාල් (භායඝාව), අන්තෝනි නොහොත් ප්‍රනාන්දු (පුතා), ආරෝකියම් (දුව), සන්දනම් (පුතා), මයිකල් නොහොත් සුසෙයි (පුතා), ප්‍රැන්සිස් (පුතා), රීතම්මා (දුව), ඥානප්‍රගාසම් (පුතා) |
| P 4146—30.11.50 | .. | පෙරියන්නන් පලනි, ඩිරේටන් වත්ත, කොටගල ... | රෙන්ගී (භායඝාව), සුබ්‍රමානියන් (පුතා), තන්ග සාමි (පුතා), ගෝවින්දරාජු (පුතා) |
| P 4152—30.11.50 | .. | අරුනාසලම් අන්නමලෙයි, ඩිරේටන් වත්ත, කොටගල | ආරායි (භායඝාව), පෙරියසාමි (පුතා), කිට්නසාමි (පුතා), පුන්ගාවනම් (දුව), රාමායි (දුව) |
| P 4190—30.11.50 | .. | අරුලාන්දු ආරෝකියසාමි, කුඩා ඩිරේටන් වත්ත, කොටගල | අන්තෝනිසාමි (පුතා), අප්පුනමාරි (දුව), අරුලාන්දු (පුතා) |
| P 4238—30.11.50 | .. | අම්මායි වීරමුත්තු, ඩිරේටන් වත්ත, කොටගල ... | පෙරිඅම්මා (දුව) |
| P 4263—30.11.50 | .. | කරුප්පන් මුරුගන්, ඩිරේටන් වත්ත, කොටගල ... | පොන්නායි (භායඝාව), වේලායුදම් (පුතා) |
| P 4372—18.11.50 | .. | පිච්චෙයි පිච්චෙයි, පහළ කොටස, දිඹුල වත්ත, කොටගල | කාලියම්මාල් (භායඝාව), මුත්තුවීරන් (පුතා) |

# මිළ පාලන දැන්වීම්

බී 21 දරණ ආහාර මිළ නියෝගය

සහල් (තොග සහ සිල්ලර)

**1950හේ අංක 29 දරණ මිළ පාලන පනත**

ඉහත සඳහන් මැයින් අංක 11,703—1959 මාර්තු 16 වැනි සඳුද ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි 815 වැනි පිටේ සඳහන් මගේ නිවේදනයේ "3 වෙනි උපලෙඛනය" යන වචන එම ගැසට් නිවේදනයෙන් අස්කළ යුතු බව මෙයින් දන්වමි.

ඊ. අයි. කාසිම්,
බදුල්ල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන.

1959 අප්‍රේල් 24 වැනි දින,
බදුල්ල කච්චේරියේ දීය.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## "කුර සහ මුව" රෝගය

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ මොරපේ ගමෙහි ගවයන් අතර "කුර සහ මුව" රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡෙද යේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වෂී 1959 ක්වූ මාර්තු මස 13 වැනි දින අංක 11,699 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ආයසීදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 අප්‍රේල් මස 20 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේ දී ය,

## "හෙමරෙජික් සෙප්ටිසීමියා" රෝගය

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආනමඩුව ආදායම් නිලධාරි කොඨාශයේ කිරිමැටිය පත්තුවේ කොන්කඩවෙල ගම්මුලාදැනි වසමේ ඉඟිනිපිටිය, රජ්රාගම සහ කොන්කඩවල යන ගම්වල ගවයන් අතර "හෙමරෙජික් සෙප්ටිසීමියා" රෝගය පැතිරී යන වැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1959 ක්වූ ජනවාරි මස 23 වැනි දින අංක 11,645 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ආයසීදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන,

1959 අප්‍රේල් මස 22 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේ දී ය,

## " හෙමරේජික් සෙප්ටිසීමියා " රෝගය

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආනමඩුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ කරඹෑව පත්තුවේ අලන්කුලම ගම්මුලාදෑනි වසමේ පහල උස්වැව සහ ඉහල උස්වැව ගම්වල ගවයන් අතර " හෙමරේජික් සෙප්ටිසීමියා " නැමති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරන (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1959 ක්වූ මාර්තු මස 13 වැනි දින අංක 11,699 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ආයසීදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 අප්‍රේල් මස 22 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේ දී ය.

## " හෙමරේජික් සෙප්ටිසීමියා " රෝගය

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මුදලිපාල ගම්මුලාදෑනි වසමේ මුදලිපාල ගමෙහි ගවයන් අතර " හෙමරේජික් සෙප්ටිසීමියා " නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1959 ක්වූ පෙබරවාරි මස 13 වැනි දින අංක 11,664 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ආයසීදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 අප්‍රේල් මස 22 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේ දී ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී